**ආඛ්‍යාන** narrations
**Volume 05 | Issue 01 | 2020 | Article 03**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

cc BY NC ND

# චිත්‍ර හා චිත්‍ර කලාවේ ඉතිහාසය පිළිබඳ ව ලියැවුණු ලිපි

(ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිති සඟරාව සහ සෙසු සඟරාවල පළවූ ලිපි ඇසුරිනි)

එම්. ඒ. එස්. ආර්. සන්ජීව් මන්ත්‍රීරත්න[5] [6]
smanthrirathnr@yahoo.com

**සාරාංශය**

සිත්තරුන්ගේ ඇඳීමේ ක්‍රමය වූ සිතුවම් කලාව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අද දක්වාම නොපිරිහී පවතී. තවමත් මෙරට පැරණි සිත්තර පරම්පරාවලින් පැවතෙන ශිල්පීහු සිටිති. එම ශිල්පීන් විසින් නිර්මිත කලාකෘති ජාතියකට පමණක් සීමා නොවී පොදු අගයක් ගන්නා අතරම විවිධ පරම්පරාවලට ආවේණික ලක්ෂණ ඒවා තුළ දැකගත හැකිය. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් ඔබ්බට නිර්මාණය වී ඇති චිත්‍ර ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. එනම් ආරාමික චිත්‍ර හා ලෞකික චිත්‍ර වශයෙනි. මෙසේ නිර්මිත චිත්‍ර පිළිබඳ පසුකාලීන විද්වතුන් විවිධ සොයාගැනීම් සහ පර්යේෂණ රාශියක් සිදුකර තිබේ. එම පර්යේෂණ මෑතකාලීන පර්යේෂණවලට ලබා දී ඇත්තේ ඉමහත් රුකුලකි. 19 වන සියවස අගභාගය සහ 20 වන සියවසේ නිර්මිත පර්යේෂණ මේ සඳහා පාදකකර ගනු ලැබීය. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ පැරණි චිත්‍ර කලාව පිළිබඳ උනන්දුවක් දැක් වූ විද්වතුන් විසින් සිදුකළ පර්යේෂණ මොනවාද යන්න සොයාබැලීමත් එම පර්යේෂණ තුළින් මෙරට චිත්‍ර කලාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති විවිධ අර්ථකථන පිළිබඳවත් සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමයි. ඒ සඳහා මෙරට චිත්‍ර කලාව පිළිබඳ පර්යේෂණ කිරීමට හා එම පර්යේෂණ ප්‍රකාශයට පත්කිරීමට මූලාරම්භයක් ලබාදුන් ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතියේ සඟරාව ප්‍රධාන මූලාශ්‍රය ලෙස ගනිමින් ඊට පසුකාලීනව රචනා වූ ශාස්ත්‍රීය සඟරා කිහිපයක් ද මෙම පර්යේෂණය සඳහා පාදක කරගනු ලැබීය.

ප්‍රමුඛ පදඃ- චිත්‍ර කලාව, සීගිරි චිත්‍ර, සැරසිලි සහ මෝස්තර

[5]Senior Lecturer, Department of History and Archaeology, University of Sri Jayewardenepura Sri Lanka,
[6]භාෂා සංස්කරණය - නාලක ජයසේන

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවට දීර්ඝ හා සංවිධානාත්මක බිතුසිතුවම් සම්ප්‍රදායක් ඇත. ඇතැම් විට එය ප්‍රාග් ඓතිහාසික සමයන්හි සිට 20වන ශතවර්ෂය දක්වාම විහිදී පවතී. මෙම සිතුවම්වලින් අති බහුතර සංඛ්‍යාවක් බෞද්ධ විහාරස්ථානවල දක්නට ලැබෙන සිතුවම් ය. එම චිත්‍ර බෞද්ධ ස්තූපවල, ධාතු ගර්භවල, භික්ෂු ආවාස ආදියෙහි නිර්මාණය කිරීම අතීතයෙහි සිට පැවති සිරිතක් බව ඓතිහාසික ලේඛනවලින් සනාථ වී ඇත. ආදිකාලීන ශිල්පීන් විසින් අඳින ලද සිතුවම් ශේෂ වී ඇති කැබලිවල පැරණි පුරාවිද්‍යාත්මක ස්ථානක ගණනාවකින් සොයාගෙන තිබේ. එමෙන් ම 18 සහ 19 වන සියවස් වලට අයත් බිතුසිතුවම් සමූහයක් ද නාගරික හා ග්‍රාමීය ස්ථානවල තවමත් ජීවමානව පවතී.

ඊට අමතරව ආගමික නොවන ලෞකික චිත්‍ර සාපේක්ෂ වශයෙන් දුර්ලභ වුවත් ලංකාවේ විවිධ ස්ථානවලින් එවැනි චිත්‍ර ද හමු වී ඇත. ඒ අතරින් දැනට ආරක්ෂා සහිතව පවතින ක්‍රි.ව. පස්වන ශතවර්ෂයට අයත් සීගිරි මාළිගයේ දක්නට ලැබෙන චිත්‍ර මෙරට පැරණි ලාංකික සිතුවම් කලාවට ලබාදෙන්නේ ඉමහත් වටිනාකමකි.

අතීතය දෙස හැරී බැලීමේ දී ලාංකීය සිතුවම් කලාව පිළිබඳ ජාතියක් ලෙස ශ්‍රී ලාංකිකයන්ට ආඩම්බර විය හැකි ය. මෙසේ ගමන් ඇරඹූ සිතුවම් කලාව හා ආ මාවත ඉතාම කම්කටොළු රාශියක් මතින් පියනැගුනක් බව ශ්‍රී ලාංකික අතීත දේශපාලන තත්ත්වය සමග සැසඳීමේ දී පෙනී යයි. විශේෂයෙන් අවුරුදු හාරසීයක පමණ බටහිර විදේශ ආධිපත්‍යයට යටත්ව සිටියත් සිංහල බෞද්ධයන් විසින් ලාංකීය සිතුවම් කලා සම්ප්‍රදාය අපමණ දුෂ්කරතා මැද රැකගෙන ඉදිරියට ගෙන එන ලදි. එසේ ආරක්ෂා කරගත් මෙරට සිතුවම් පිළිබඳ පර්යේෂකයන් විසින් සිදුකරනු ලැබූ පර්යේෂණ බොහොමයක් දක්නට පුළුවන. එම පර්යේෂණවලට මූලාරම්භයක් සහ ශික්ෂණයක් ප්‍රථමවරට ලැබී ඇත්තේ ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතිය වන අතර පසුකාලීනව තවත් සඟරා සහ විවිධ පර්යේෂණ කෘති බිහිකරමින් ලංකාවේ චිත්‍රකලාවේ ඉතිහාසය පිළිබඳ පර්යේෂණ සාකච්ඡාව ඉදිරියට ගෙනගොස් ඇති බව අපට දැකගත හැකිය.

ලංකාවේ චිත්‍ර හඳුන්වාදීම හා චිත්‍ර කලාවේ ඉතිහාසය නැවත ගොඩ නැගීම සඳහා ශ්‍රී ලාංකීය රාජකීය ආසියාතික සමිතියේ සඟරාවේ පළ වී ඇති ලිපිවලින් පුරෝගාමී සේවාවක් සිදු වී ඇති බව පෙනේ. මෙම ලිපිවලින් අනුරාධපුර, පොළොන්නරු සහ නුවර යන යුගවලට අදාළ චිත්‍ර පිළිබඳව විවරණය කර තිබේ. ඒ අතරින් ලිපි කිහිපයක් මෙම පර්යේෂණය සඳහා යොදා ගත්තෙමු. එයින් Some Unrecorded Frescoes From Sigiriya[7] යන ලිපිය පී.ඊ.පී. දැරණියගල විසින් සපයන ලද්දකි. පිටු අටකින් සමන්විත කුඩා ලිපියක් වුවත් ලංකාවේ දුර්ලභ ගණයේ චිත්‍ර

[7] . Deraniyagala, P.E.P. “ Some Unrecorded Frescoes from Sigiriya” , JRAS (CB), Vol, xxxviii No.106, 1948, pp.84-89.

සම්ප්‍රදායක් වූ පසුව ලෝකප්‍රකට වූ සීගිරි චිත්‍ර පිළිබඳ ආරම්භක විග්‍රහයක් ඇතුළත් වේ. මෙම ලිපියෙන් සාකච්ඡා කෙරෙනුයේ සීගිරියේ ප්‍රධාන පර්වතයට සම්බන්ධ චිත්‍ර පිළිබඳ ව නොවේ. එයට බටහිරින් ඇති නයිපෙණ ගුහාව නමින් හඳින්වෙන ස්ථානයේ ඇති චිත්‍ර පිළිබඳව ය.

1947 ප්‍රථම වරට සොයාගත් මෙම සීගිරි සිතුවම් දෙවරක් පරීක්ෂාවට ලක්කර තිබෙන අතර එස්. අබේසිංහ දෙවනවර පරීක්ෂණයේ දී එම සිතුවම් පිටපත් කරගත් බව දැරණියගල සඳහන් කරයි. සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් එහි සිතුවම් විසි දෙකක් අනාවරණය වූ බව සඳහන් කරන දැරණියගල එම චිත්‍රවලින් නිරූපිත ලක්ෂණ එකින් එක හඳුන්වා දෙමින් ඒවායේ ආලේපිත වර්ණ සහ වර්ණ ගන්වා ඇති අයුරු ද විස්තර කර ඇත.[8] එම චිත්‍රවල ශේෂව පවත්නා වර්ණ නිසා අතීතයේ මෙම චිත්‍ර දීප්තිමත් ව වර්ණ ගන්වා තිබෙන්නට ඇතැයි දැරණියගල අනුමාන කරයි.

සීගිරි ප්‍රධාන පර්වතයේ ඇති සිතුවම් සහ නයිපෙණ ගුහාවේ සිතුවම් පිළිබඳව කරන සන්සන්දනාත්මක විග්‍රහය මෙම පත්‍රිකාවේ ඇති වඩාත් වැදගත් අංගය යි. නයිපෙණ ගුහාවේ ඇති චිත්‍රවල පිටත සීමාවේ ඉරි කීපයක් දක්නට ලැබෙන බවත් ඒවා චිත්‍රය සකස් කිරීමේ දී අඳින ලද රේඛා සටහන් බවත් සඳහන් කරන එතුමා සීගිරි චිත්‍ර අතරින් වඩාත් පැරණි ම චිත්‍ර නයිපෙණ ගුහාවේ චිත්‍ර බවත් සඳහන් කරයි. මෙවැනි ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථානයකට දේශගුණික විපර්යාසයන් නිසා එල්ලවන අහිතකර බලපෑම් හේතුවෙන් ඒවා විනාශ වීමේ තර්ජනයකට ලක් වී තිබෙන බවත් දැරණියගල පෙන්වා දී ඇත. සීගිරි චිත්‍රවල ප්‍රභවය නයිපෙණ ගුහාවේ චිත්‍රවලින් ආරම්භ වූ බව ප්‍රථමයෙන් ම පෙන්වා දුන්නේ මෙම ලිපිය මගිනි.[9]

මේ අනුව, එතෙක් පර්යේෂණයට බඳුන් නොවූ එමෙන් ම අභාවයට යමින් තිබූ චිත්‍ර පිළිබඳවත් ලංකාවේ දුර්ලභ ගණයේ සිතුවම් කලාවක් පිළිබඳවත් කර ඇති මෙම විග්‍රහය තුළින් මෙරට චිත්‍රකලාව අද්විතීය ඉතිහාසයකට උරුමකම් කියන බව සනාථ කර වීමට සමත් විය. එතුමා මෙම ලිපියෙන් ඉදිරිපත් කරන ලද නයිපෙණ ගුහාවේ චිත්‍ර කෙතරම් නම් කලා විචාරකයන්ගේ සැලකිල්ලට ලක් වූවා ද යන්න යථෝක්ත ලෙණ ''දැරණියගල ලෙණ'' යනුවෙන් නම් කිරීමෙන් ම පෙනේ.[10]

තවද මෙම චිත්‍ර පිළිබඳ ව විස්තරාත්මක අධ්‍යයනයක යෙදුණ නන්දන චූටිවොංග්ස්, ලීලානන්ද ප්‍රේමතිලක හා රෝලන්ඩ් සිල්වා ගේ කීමක් උපුටා දැක්වීම යෝග්‍යයැයි පෙනේ. ඒ මෙසේ ය :''නයිපෙණ ගුහාවේ සැරසිලි සංරක්ෂණ ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය චිත්‍රකලා ඉතිහාසයේ

---

[8]Ibid, p.87.

[9]Ibid, p.85.

[10]ද සිල්වා, රාජා ''චිත්‍ර කලාව'' (ආදි යුගය ක්‍රි.පූ.247 සිට ක්‍රි.ව.800 තෙක්), පරිවර්තනය, ජයවර්ධන, ඩබ්ලිව්. පී, චිත්‍ර කලාව, (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශතසංවත්සරය 1890-1990 සමරුපොත් පෙළ) සංස්කාරක, විජේසේකර, නන්දදේව, පුරාවිද්‍යා දෙපාර්තමේනතුව, 1990, 25-28 පිටු.

අනන්‍යසාධාරණ ත්‍රිත්වයක් සනිටුහන් කරයි. අපූර්ව ආඩ්‍යත්වයක් ගම්භීරත්වයක් හා මනා සංයමයක් සහිත අලංකරණ ශෛලියක් පෙන්නුම් කිරීමට ප්‍රමාණවත් සැරසිලි මෝස්තර අදත් වියන් තලයේ දැකිය හැකි ය. ජලජ පක්ෂියකුගේ හා තිමිංගල මත්ස්‍යයකුගේ කාල්පනික හා ශෛලිගත ආකෘති ජ්‍යාමිතිය දියමන්ති හා වෘත්තාකාර මුද්‍රිකාවනට ඒකාබද්ධ කර ඇත. සජීව ආකෘති ඒවායේ ඒවායේ සකල ඕජෝ චලන හා සංකීර්ණ විස්තර විභාග සහිතව ජ්‍යාමිතීය චතුරශ්‍රවලට, දියමන්ති ආකෘතිවලට, වෘත්තයන්ට හා ඍජු රේඛාවලට සාර්ථකව ඒකාබද්ධ කොට තිබේ. ඉහළ පර්වත පෘෂ්ඨයෙහි ලා නොපෙනෙන අවධානයක් මෙහි විස්තර විභාග හා වර්ණ කෙරෙහි යොමු කොට ඇත.[11]

Some Survivals in Sinhalase Art නමින් ආනන්ද කුමාරස්වාමි විසින් ද සඟරාවට ලිපියක් සපයා ඇත.[12] එම ලිපියේ තේමාව වී ඇත්තේ මෙරට චිත්‍රවල ඇති සැරසිලි මොස්තර යි. විශේෂයෙන් ඉන්දියාවේ භාරුත්වල ඇති චිත්‍ර සහ ලංකාවේ චිත්‍රවල ඇති සැරසිලි මෝස්තර සහ ඒවායේ සමවිසමතා එහි සාකච්ජාවට භාජනය වී ඇත. මෙය, ලංකාවේ චිත්‍රවල නිරූපිත කාන්තා සහ පිරිමි රූපවල ඇති ආභරණ හඳුනාගෙන, ඒවා පිළිබඳ විස්තර කථන ඉදිරිපත් කරමින්, ඉන්දියාවේ මීට සමීප පර්යේෂණ කටයුතු සිදුකළ කනිංහැම්ගේ භාරත ස්තූප නම් පොතින් ද උදාහරණ ගෙන සකස්කර ඇති ශාස්ත්‍රීය ලිපියකි.[13]

සීගිරියේ චිත්‍ර සම්බන්ධයෙන් මෙම ලිපියෙන් අදහසක් ඉදිරිපත්කරන කුමාරස්වාමි, අජන්තාවේ සිතුවම් සහ මෙරට සිතුවම් අතර සාම්‍යත්වයක් පවතින්නේ ලාංකික චිත්‍රශිල්පීන් අජන්තා චිත්‍ර අනුකරණය කළ නිසා බව කියයි.[14] ලංකාවේ සැරසිලි මෝසතර කලාවට ඉන්දියානු ආභාසයට අමතරව ග්‍රීක සහ ඊජිප්තු කලාවන්ගේ ආභාසය ද ලැබී තිබේ. මෝස්තර හැඩතලවල මුල් අවස්ථාවල ඊජිප්තු සිතුවම්වලින් ලැබුණු බව Flinders Petrie විසින් රචිත Egyptian Decorative Art නම් කෘතියේ ද සඳහන් බව ආනන්ද කුමාරස්වාමි පෙන්වා දෙයි. ග්‍රීක ආභාසය මුලින් ඉන්දියානු චිත්‍ර තුළින් දර්ශනය වූ අතර පසු ව ලංකාවේ චිත්‍රවල ද එම ලක්ෂණ දක්නට ලැබිණි. කොළඹ කෞතුකාගාරයේ ඇති පිඟන් ගඩොල්, පුස්කොළ පොත් කම්බ, කළගෙඩි සැරසිලි, ආදිය තුළින් ග්‍රීක ආභාසය මෙරට චිත්‍ර කලාවට ලැබුණු බවට සාක්ෂි වශයෙන් සඳහන් කරයි.[15]

Ancient Ceylon සඟරාවට ලීලානන්ද ප්‍රේමතිලක විසින් සපයා ඇති Some Lesser Known Paintings of Sri Lanka නම් ලිපියෙන් පර්යේෂණයට භාජනය නො වූ චිත්‍ර පිළිබඳ ව

---

[11] වූට්වොංග්ස්, නන්දන ප්‍රේමතිලක, ලීලානන්ද සිල්වා, රෝලන්ඩ්. ශ්‍රී ලංකා බිතුසිතුවම් : සීගිරිය, 1990, කොළඹ, 19 පිටුව.
[12] Comaraswamy, A.k. " Some Survivals in Sinhalese Art", JRAS (CB), Vol.xix, No.57, 1906, pp.73-80.
[13] Ibid,pp.74-75.
[14] Ibid,p.79.
[15] Ibid,p.81.

අදහසක් ඉදිරිපත් කර තිබේ. මේ පර්යේෂණය විද්වත් මණ්ඩලයක ප්‍රතිඵලයකි.[16] එම පර්යේෂණය මගින් බිත්තිවල අදින ලද චිත්‍ර සහ ඒවායේ තාක්ෂණ ශෛලිය සහ ඒවාට සම්බන්ධ ගුරුකුල පිළිබඳ ව සාකච්ඡා කර තිබේ. බදුල්ල දිස්ත්‍රික්කයේ බුදුගේකන්ද, මොණරාගල දිස්ත්‍රික්කයේ මුප්පනේ සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කොට්ටිඉඹුල්වැව යන විහාර මෙම පර්යේෂණය සඳහා පාදක කරගත් ස්ථානයෝ ය.[17]

බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති බුදුගේකන්ද විහාරය කුඩා ගොඩනැගිල්ලක පිහිටා තිබේ. හේන් ගොවිතැනින් ජීවත්වන ග්‍රාමීය ජන කණ්ඩායමකගේ පරිශ්‍රමයෙන් විහාරයේ නඩත්තු කටයුතු සිදු කෙරේ.

කටාරමක් සහිත ගල්ලෙනක චිත්‍ර නිර්මාණය කර ඇති අතර ඒවා නුවර යුගයේ සිත්තර සම්ප්‍රදායට අයත් ය. මුප්පනේ ඇති චිත්‍ර මෙම සම්ප්‍රදායට නැකම් කියයි. මුපප්නේ සහ බුදුගේකන්ද ඇති මකර තොරන් දෙකෙහි ඇති සමවිසමතා ඉදිරිපත් කරමින් දස බෝධිසත්ව රූප සහ ඒවායේ මානව රූපී ලක්ෂණ පිළිබඳ ව ද විස්තර ඉදිරිපත් කර ඇත.[18] කොට්ටිඉඹුල්වැව චිත්‍ර මධ්‍යකාලීන යුගයට අයත් බවත් දඹුල්ලේ ඇති නො. 2 දරන ගුහා චිත්‍රවලට සමාන බවත් ඔවුහු සඳහන් කරති. ප්‍රතිමාගෘහයේ සිවිලිමේ ඇඳ ඇති චිත්‍රයෙහි අනෝතත්තවිල, දියගලායන දොරටු සතරක් සහ හිමාලය දර්ශනයක් පිළිබිඹු වේ. එහි ඇති විශේෂත්වය නම් රෙදි උපයෝගීකරගෙන නිර්මාණය කළ චිත්‍ර ඇතුළත් වීමය යි.

දඹුල්ලේ ඇති චිත්‍ර සහ කොට්ටිඉඹුල්වැව චිත්‍ර සංකල්ප වශයෙන් සමාන නමුදු කොට්ටිඹුල්වැව චිත්‍ර සජීව ගුණයෙන් යුතු බව ලීලානන්ද ප්‍රේමතිලක අදහස් කරයි. කොට්ටිඹුල්වැව චිත්‍රවල ශෛලිය විඥානවාදී තේමාවක් නිදහසේ ඉදිරිපත් කිරීමක් නිසා ආකර්ශනාත්මක ලෙස චිත්‍ර නිර්මාණය වී ඇති බව තවදුරටත් ඔහු පෙන්වා දෙයි.

පර්යේෂණ කණ්ඩායම විසින් අභාවයට යමින් පවතින චිත්‍ර පිළිබඳ කර ඇති මෙම පර්යේෂණය වඩාත් කාලෝචිත ය. එම චිත්‍රවල ශෛලිය, සමකාලීන සමාජ පසුබිම ආදිය හොඳින් අධ්‍යයනයට යොමුකර තිබෙන කාරනා අතර වේ. එම නිසා Ancient Ceylon සඟරාවේ ප්‍රකාශිත චිත්‍ර ශිල්පය පිළිබඳ පර්යේෂණ ලිපි, චිත්‍රකලා ඉතිහාසය අධ්‍යයනය කරන්නන්ට ඉමහත් සේවයක් සපයා දෙයි. ඔවුන්ගේ මෙම පර්යේෂණවලට මූලික වශයෙන් පාදක වී ඇත්තේ සඟරාව මගින් පළ කළ ඉහත සඳහන් ලිපි ය.

මූලික වශයෙන් එම ලිපිවලින් ලැබූ ආභාසය මත සිතුවම් කලාව පිළිබඳ පර්යේෂණය කළ මෙරට සිටින තවත් විද්වතෙකි, ආචාර්ය නන්දදේව විජේසේකර University of Ceylon

---

[16]Nandand Cutiwongs,(University of Amsterdam), Leelananda Prematilleke, (University of Peradeniya), Roland Silva (Archaeology Survey of SriLanka)

[17] Prematilleke, Leelananda''Some Lesser Known Paintings of SriLanka'' Ancient Ceylon,vol04,No.10,1970,pp.291-298

[18]Ibid,p.292.

Review සඟරාවට Evolution of Sinhalese Painting[19]නම් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේ.



ආරම්භයේ සිට දොළොස්වන ශතවර්ෂය දක්වා මෙරට චිත්‍ර කලාවට අදාළ කරුණු ගොනුකර ඇති මෙම ලිපිය සඳහා මහාවංශය ද උපයෝගී කරගෙන තිබේ. බුද්ධාගම මෙරට ස්ථාපිතවීමත් සමග මෙරට චිත්‍ර කලාවේ වර්ධනයක් ඇති වූ බවත් ඊට ප්‍රථම නොදියුණු සමාජවල පැවති නැටුම් කලාව චිත්‍ර ඇඳීමේ මූලාරම්භය බවත් සඳහන් වේ. වංශකථාගත පණ්ඩුකාභය පුරාවෘත්තය, නොයෙක් මිථ්‍යා විශ්වාස ආදියෙන් ගහණ ව තිබුණත් නාටය රඟ දැක්වීම ප්‍රාථමික ගෝත්‍රවල පවා තිබුණු බැවින් මෙ අදහස පිළිගැනීම දුෂ්කර නොවේ.[20] පුරාණයේ පටන් යම් කලා සම්ප්‍රාදයක් මෙරට තිබුණු බවත් එය බුදුදහම මෙරට ස්ථාපිත වීමත් සමග වෙනස්මගක් ගත් බව විජේසේකර පෙන්වා දෙයි. මේ අනුව කලා සම්ප්‍රදාය දෙකක් බිහිවිණි. ජනප්‍රිය ආගමික කලාව සහ අද්භූත දේවල් සම්බන්ධ කලාවයි. ජනප්‍රිය කලාව සිංහල චිත්‍ර කලාව තුළ පිළිඹිබු වූ බව එතුමාගේ අදහස යි.

දුටුගැමුණු රාජ්‍ය සමයේ රෙදිකඩක් මත හිංගුලිවලින් ඇඳ තිබූ චිත්‍ර පිළිබඳවත්[21] ජාතක කථාවල සඳහන් බෝධිසත්ව චරිතයේ අවස්ථා චෛත්‍යයේ ධාතු ගර්භයේ නිරූපණය කර ප්‍රදර්ශනය කළ බවත් මහාවංශයේ ඇති තොරතුරු ආශ්‍රයෙන් පෙන්වා දී තිබේ.[22] මීට සමාන චිත්‍ර මිහින්තලේ සහ දැදිගම ස්තූප දෙකේ ධාතු ගර්භවලින් ද හමු වූ බව නන්දා වික්‍රමසිංහ පෙන්වා දෙයි. ලංකාවේ ස්තූපවල ධාතුගර්භ චිත්‍රවලින් සැරසීමේ සිරිත ක්‍රිස්තු පූර්ව යුගයේ සිට පැවති බව මේ පුරාවිද්‍යා සාධකවලින් ඔප්පුවන අතර ම චිත්‍රකලාවේ ජනප්‍රිය අංශයක් ද පැවති බව සනාථ කිරීම සඳහා එතුමා ඉදිරිපත් කරන උදාහරණ ද විශ්වසනීයත්වයක් ගනී.

සීගිරි චිත්‍ර පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස සාකච්ඡා කරන විජේසේකර, ආනන්ද කුමාරස්වාමි සඟරාව මගින් සංවාද ඉදිරියට ගෙන යමින් ඒවා අජන්තා සම්ප්‍රදායට අයත් බව පිළිගනියි. මෙරට ඇති වූ පුනර්ජීවනයක ප්‍රතිඵලයක් සීගිරි චිත්‍ර තුළින් නිරූපණය වන බවත් එම සම්ප්‍රදාය කාලයාගේ ඇවෑමෙන් විනාශ වී ගොස් තිබීම අවාසනාවක් බව ද සඳහන් කිරීම තුළින් ඒවා සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව ද පෙන්වා දෙයි. පුල්ලිගොඩ සහ දඹුල්ල චිත්‍ර ජනප්‍රිය සම්ප්‍රදායට තවත් උදාහරණයක් බව පවසන ඔහු, ස්වභාවධර්මයේ අවස්ථා ද උපකාරයෙන් ඒවා නිර්මාණය කර තිබීම එහි ඇති තවත් සුවිශේෂත්වයක් බව පෙන්වා දෙයි.[23]

---

[19] Wijesekara. nandadeva, ''Evolution of Sinhalese Painting'', University of Ceylon Review, vol. iii.No.2,1945,pp.1-48

[20]Ibid,p.1.

[21]මහාවංශය, පරිවර්තනය, ශ්‍රී සුමංගල නායක හිමි සහ දේවරක්ෂිත බටුවන්තුඩාවේ, එස්. ගොඩගේ සහ සමාගම, විසිහත්වන පරිච්ඡේදය, 1996, 18-20 ගාථා

[22]එම, 79-88 ගාථාව

[23] Wijesekara. nandadeva, ''Evolution of Sinhalese Painting'', University of Ceylon Review, vol. iii.No.2,1945,p.47

දහහත්වන සහ දොළොස්වන ශතවර්ෂවල මෙරට තිබුනු චිත්‍ර සම්බන්ධයෙන් ද විජේසේකර තොරතුරු සපයා තිබේ. දහවන ශතවර්ෂයේ දී මෙරට ඇති වූ වියවුල් ස්වභාවය මත සියලු කටයුතු අඩපණ වුව ද දොළොස්වන ශතවර්ෂයේ දී නැවත උද්දීපනය ඇති වී තිබේ. රටේ වියවුල්කාරී අවස්ථාවල දී පැවති චිත්‍ර කලාව ආරක්ෂා කර ගෙන තිබුණේ පන්සල්වල ඇබිත්තකම් කළ පුද්ගලයන් ය. දොළොස්වන ශත වර්ෂයේ දී මෙරට කලාවේ පුනර්ජීවනයට ඉවහල් වූයේ, ආභාසයයි. ඊට ප්‍රථමයෙන් පල්ලව හා පාණ්ඩ්‍ය බලපෑම් එල්ල විය. එහෙත් මෙරට පැවති කලා සම්ප්‍රදායත් අතර වෙනස්කම් රැසක් දක්නට ලැබෙන බව පෙන්වා දෙයි.[24]

**නිගමනය**

ශ්‍රී ලංකාවේ චිත්‍ර ශිල්පය පිළිබඳ සඟරාවේ අඩංගු ලිපි අතළොස්සක් වුව ද ඒවා වටිනා ශාස්ත්‍රීය ප්‍රකාශන වන්නේය. දිවයිනේ චිත්‍රකලාව පිළිබඳ ව සොයා ගනු ලැබූ නව සාධක එනම් චිත්‍ර හා තාක්ෂණික ලක්ෂණ එම ලිපි මගින් පළමුවන වරට කලා ඉතිහාසඥයින් ධෛර්යමත් කළ අතර ම අදාළ විෂයේ අභිවර්ධනයට ද ඉමහත් දායකත්වයක් සපයනු ලැබිණ. එම පසුබිම මත පිහිටා වියතුන් විසින් ලංකාවේ පුරාණ චිත්‍ර හා චිත්‍ර ශිල්පය පිළිබඳ ගවේෂණ සහ අර්ථදැක්වීම් පසුකාලීන වෙනත් සඟරා ආදිය මගින් ද කර ඇත. ලීලානන්ද ප්‍රේමතිලක හා නන්දදේව විජේසේකර ඒ අතරින් කැපී පෙනෙති. මෙරට චිත්‍ර ශිල්පය පිළිබඳ ව නව අර්ථකථන ඉදිරිපත් කරමින් ද සැඟව විනාශ වී යාමට ඉඩ තිබුණු චිත්‍ර සොයාගෙන ඒවා වාර්තා කිරීමෙන් ද ඒ වියතුන් විසින් මෙරට චිත්‍රකලාවට මහඟු සේවයක් කර තිබේ. ඒ සඳහා ප්‍රථමයෙන් ම උනන්දුවක් ඇති කිරීමේ ගෞරවය ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතියේ සඟරාවට හිමි වෙයි. මේ නිසා මෙරට චිත්‍රකලාව පිළිබඳ නිපුණතාවයක් ඇති පර්යේෂකයන් බිහිවූයේ සමිතියේ පුරෝගාමීත්වය නිසා බව කීම අතිශයෝක්තියක් නොවේ.

[24]Ibid,p.49.